// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,669 — 1966 පෙබරවාරි 11 වැනි සිකුරාද — 1966.2.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 17 | මෝස්තර ආඥපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන ... ... | 18 | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරාද හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවල දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විශේෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දැන්වීම් හැර, අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැම්දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

17——බී 64014—4,903 (66/2)
C 1

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස වීධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

වර්ෂ 1964 ක් වූ ජනවාරි මස 30 වන දින දරණ 5372 වන අංකය (අංක 1585/63 දරණ ස්විට්සර්ලන්ත ඉල්ලුම් පතේ සඳහන් වන 63.2.8 වන ප්‍රමුඛතා දිනයට හිමිකර පාමින් ඉදිරිපත් කෙරුණු ගිවිසුම් ඉල්ලුම් පතයි).


F. HOFFMANN-LA ROCHE & Co. AKTIENGESELLSCHAFT

"සල්පපිරිමිඩින සහ ඒවා නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාවලියක්."


සංක්ෂේප සටහන :—

III නැමැති සාමාන්‍ය සූත්‍රය ඇති, ආදේශ පිරිමිඩින නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාවලියක් විස්තර කොට තිබේ. මෙහි Ac වූකලි ඇසිල් අවශේෂයකි.


I නැමැති සාමාන්‍ය සූත්‍රය ඇති සංයෝගයක්, අම්ලනකාරකයක් සමග ප්‍රතික්‍රියා කොට II නැමැති සාමාන්‍ය සූත්‍රය ඇති $N^1$-අම්ලනකෘත සංයෝගයක් සාදගනු ලැබේ. මෙහි R වූකලි ඔක්සිහරණයෙන් හෝ ජලවිච්ඡේදනයෙන් හෝ ඇමයිනො කාණ්ඩයක් බවට පරිවර්තනය කළ හැකි කාණ්ඩයක් වෙයි. ඉක්බිති II නැමැති සාමාන්‍ය සූත්‍රය ඇති සංයෝග, ඔක්සිහරණය කිරීමෙන් හෝ ජලවිච්ඡේදනය කිරීමෙන් හෝ III නැමැති සාමාන්‍ය සූත්‍රය ඇති සංයෝග සාද ගනු ලැබේ.



(I)



(II)



(III)

මෙකී සංයෝග අන්තර්ගත, ඖෂධීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාවලියක් විස්තර කොට තිබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 13 ක්ද නිදසුන් 3ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක් වූ සැප්තැම්බර් මස 6 වන දින,
කොළඹ දී ය.

2—389

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි